Draft

# ඉතිහාසය

## ගුරු මාර්ගෝපදේශය

## 9 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල: info@nie.lk

ඉතිහාසය

9 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

# Draft

ප්‍රථම මුද්‍රණය 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN ..............

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
භාෂා මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : nifo@nie.lk

මුද්‍රණය : මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

Draft

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයක අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමඟ සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන්ගේ හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

Draft

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්තක. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුශලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

Draft

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

2007 වර්ෂයේ සිට පාසල් විෂය මාලාවේ හර විෂයක් ලෙස ක්‍රියාත්මක වූ ඉතිහාසය 2015 වර්ෂයේ සිට එලෙස ම ක්‍රියාත්මකවන අතර 6 - 9 ශ්‍රේණි සඳහා සතියකට කාල පරිච්ඡේද දෙකක් හා 10 - 11 ශ්‍රේණි සඳහා සතියකට කාලපරිච්ඡේද තුනක් වෙන්කර ඇත.

අ.පො.ස.(සා.පෙළ) විභාගයට 10 - 11 ශ්‍රේණි සඳහා නියමිත විෂය නිර්දේශ පදනම් කරගෙන ඇගයීම සිදු කිරීමට යෝජිතය.

6 - 11 ශ්‍රේණි සඳහා නිපුණතා පාදක ප්‍රවේශයට ප්‍රධාන නිපුණතා විස්සක් යටතේ ඉතිහාසය විෂයමාලාව ගොඩනගා ඇත. එම විෂයමාලාව ක්‍රියාත්මක කිරීමට සකසා ඇති මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශය හා විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට මගපෙන්වීම යන කොටස් දෙකකින් සමන්විතය.

ඉතිහාසය විෂය තුළින් සිසුන් තුළ ප්‍රගුණ කිරීමට අපේක්ෂිත නිපුණතා සංවර්ධනය කිරීමේ දී විෂය කරුණු මෙන් ම විෂය කරුණු අධ්‍යයනය කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් ද වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගුරු කාර්ය පහසු කර ගැනීම සඳහා විෂය අන්තර්ගතයෙ හි ඇතැම් කොටස් ආවරණය වන පරිදි නිදර්ශක ක්‍රියාකාරකම් මෙයට ඇතුළත්කර ඇත. ඔබගේ නිර්මාණශීලී හැකියාවන් ප්‍රයෝජනයට ගනිමින් පන්ති කාමර අවශ්‍යතාවන් අනුව මෙම ක්‍රියාකාරකම් තවදුරටත් සංවර්ධනය කිරීම හා නව ක්‍රියාකාරකම් සැකසීමට හැකිය. මෙහි දී සැලකිලිමත් විය යුත්තේ ඉතිහාසය විෂයේ අරමුණු ඉටුවන පරිදි අවම වශයෙන් 50%ක් වත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අවස්ථා සම්පාදනය කරමින් නියමිත විෂය කරුණු අධ්‍යයනයට සිසුන් යොමු කිරීමයි.

ඒ අනුව ඉතිහාසය විෂයේ අරමුණු ඉටුකරමින් නිපුණතා සපිරි නව ලොවකට උචිත සිසු පිරිසක් බිහිකිරීමට අත්වැලක් සැපයීම මෙමගුරු මාර්ගොපදේශයෙන් අපේක්ෂා කෙරේ. මේ සම්බන්ධයෙන් ඔබගේ සංවර්ධනාත්මක අදහස් හා යෝජනා අපවෙත යොමුකරන මෙන් ද කාරුණික ව ඉල්ලා සිටිමු.

**විෂයමාලා කමිටුව**

# Draft

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**සම්බන්ධීකරණය**

ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

**විෂය විශේෂඥ සහාය**

:

| | |
|---|---|
| මහාචාර්ය ඉන්ද්‍රාණි මුණසිංහ | කොළඹ විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය යූ.බී කරුණානන්ද | කැලණිය විශ්ව විද්‍යාලය (සේවා සම්මානිත මහාචාර්ය) |
| මහාචාර්ය කේ.එම්.පී කුලසේකර | කැලණිය විශ්ව විද්‍යාලය |
| මහාචාර්ය පත්මසිරි කන්නන්ගර | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය |

**ලේඛක මණ්ඩලය (බාහිර)**

| | |
|---|---|
| මේරි ඩොනේටා කන්‍යාසොයුරිය | විදුහල්පති (විශ්‍රාමික)<br>ශාන්ත අන්තෝනි ජාතික පාසල, වත්තල |
| කේ.එස්. රංජනී | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හොරණ |
| කේ.වී.එස්. විජයමාලා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කැලණිය |
| එච්.එම්. නලින් බණ්ඩාර | කුරුවිට මධ්‍ය මහා විද්‍යාලය, කුරුවිට |
| එච්.එම්.එච් යාකුත් | ප්‍රධාන ව්‍යාපෘති නිලධාරි (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| රෙස්ටා ප්‍රියන්ති ප්‍රනාන්දු | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය |

**ව්‍යාපෘති කමිටුව**

| | |
|---|---|
| ඩී.එච්.චන්දිමා නිෂානි ධර්මපාල : | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, |
| ඩබ්. සමන්ති ශිරෝමාලා ගුණවර්ධන | කථිකාචාර්ය, සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව |

**භාෂා සංස්කරණය**

ශ්‍රීනාත් ගනේවත්ත මයා — කජුවත්ත, ගොතටුව, අංගොඩ,

# Draft

## පටුන


| | පිටුව |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්හිමිගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| **විෂය නිර්දේශය** | vii - xxii |
| **9.1 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම** | 01 - 06 |
| **9.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය** | **07 - 11** |
| **9.3 ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය** | **12 - 14** |
| **9.4 ඉන්දියානු නිදහස් සටන** | **15 - 19** |
| **9.5 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය** | **20 - 24** |
| **9.6 නිදහසින් පසු ශ්‍රී ලංකාව** | **25 - 28** |

Draft



# ඉතිහාසය

## විෂය නිර්දේශය

## 9 ශ්‍රේණිය

(2018 සිට ක්‍රියාත්මක වේ)

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

# Draft

## හැඳින්වීම

තම රටේ අනන්‍යතාව හඳුනාගනිමින් , ඒවා රැකගනිමින් ලෝක තත්ත්වයන්ට මුහුණ දිය හැකි, දැ හිතකාමී, ශක්තිමත් ශ්‍රී ලාංකික පුරවැසියකු බිහි කර ගැනීමේ අරමුණු පෙරදැරි කර ගෙන පාසල් විෂයමාලාවේ හර විෂයයක් ලෙස ඉතිහාසය විෂය 2007 සිට ක්‍රියාත්මක වේ.

මෙම අරමුණු වඩාත් පෝෂණය කරමින් 2015 දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ජාතික පොදු අරමුණු සහ ජාතික පොදු නිපුණතා ද පාදක කර ගනිමින් ඉතිහාසය විෂයයට අදාළ ව නිපුණතා විසිතුනක් යටතේ 6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය තෙක් ඉතිහාසය විෂයමාලාව නිපුණතා පාදක ක්‍රමවේදය යටතේ සකස් කර ඇත.

9 වන ශ්‍රේණිය සඳහා වූ මෙම විෂය නිර්දේශය එහි ප්‍රතිඵලයකි. 2018 සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙහි නිපුණතා හයක් අධ්‍යයනය සඳහා යොමු කර ඇත. මෙම තේමා මඟින් ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය හා එහි බලපෑමත්, විදේශාධිපත්‍යය හමුවේ දේශීය ක්‍රියාකාරිත්වයත්, දේශයේ ස්වාධීනත්වය සඳහා සටන් කළ ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරයත් නිදහස දිනා ගැනීම හා නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපාරත් පිළිබඳ ව අධ්‍යයනය කරනු ලැබේ. පාසල් වාර අනුව මෙම ඒකක බෙදා ඇති ආකාරය පහත වගුවේ දැක්වේ.

| වාරය | ඒකක |
|---|---|
| i වාරය | 1 , 2 |
| ii වාරය | 3 , 4 |
| iii වාරය | 5 , 6 |

# Draft

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරණු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

x

IV පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුලු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපන තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# Draft

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම



තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා:
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

Draft

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම, තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම, හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. (

උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

Draft

## ඉතිහාසය විෂයයේ අරමුණු

6 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය තෙක් වූ විෂයමාලාව අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කර ගනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ වටහා ගැනීම
2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම
3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමය සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම
4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම
5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම
6. කාලානුපිළිවෙල, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම
7. වැදගත් ඓතිහාසික පුද්ගලයන්ගේ චරිතාපදාන චරිතායනය කර ගැනීම
8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම
9. කාලය හා අවකාශය පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම
10. ඓතිහාසික තොරතුරු ඇසුරෙන් ස්ථාන හඳුනා ගැනීම

# Draft

**ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව**

| ජාතික පොදු අරමුණ | විෂයය අරමුණ | නිපුණතා මට්ටම |
|---|---|---|
| I. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාවතහවුරු කිරීම | 3. ජාතික අනන්‍යතාව හඳුනාගෙන දේශීය උරුමයන් සුරකිමින් දැහිතකාමී පුරවැසියකු බවට පත්වීම<br><br>4. ජාතික ප්‍රශ්න දෙස තුලනාත්මක ව බැලීම<br><br>5. අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරිම | 3.1 විදේශීය බලවේග හමුවේ දේශීයත්වය රැකගත යුතු බව පෙන්වා දෙයි |
| II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම | 2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම | 1.1 මුහුදුබඩ පළාත්වල ලන්දේසි ක්‍රියාකාරිත්වය විමසා බලයි |
| III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ ව දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම | 1. ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳ අවබෝධයෙන් ඉතිහාසය පුරා සිදු වූ වෙනස්කම් පිළිබඳ ව වටහා ගැනීම<br><br>2. අතීතය හැදෑරීමෙන් ලැබෙන අවබෝධය මඟින් වර්තමානය තේරුම් ගැනීම හා අනාගත තත්ත්වයන් දැකීම | 5.1 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධන විමසා බලයි |

Draft

| ජාතික පොදු අරමුණු | විෂයය අරමුණු | නිපුණතා මට්ටම |
|---|---|---|
| VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම | 6. කාලානුපිළිවෙළ, මූලාශ්‍රය විවේචනය හා හේතුඵල සම්බන්ධය ඇසුරෙන් ගොඩනැගෙන විචාරාත්මක ශික්ෂණය හා දැනුම ප්‍රායෝගික ජීවිතයට භාවිත කිරීම | 6.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික සංවර්ධනය විස්තර කරයි |
| VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම | 8. ඓතිහාසික ගෝලීය ප්‍රවණතා මෙරට ඉතිහාසය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ අවබෝධයෙන් ලෝක ප්‍රවණතාවලට මුහුණ දීමේ ශක්තිය ඇති කර ගැනීම | 1.1 මුහුදුබඩ පළාත්වල ලන්දේසි ක්‍රියාකාරිත්වය විමසා බලයි<br>2.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය ස්ථාවර වූ ආකාරය පෙන්වා දෙයි<br>2.2 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ආර්ථික කටයුතු පැහැදිලි කරයි |
| VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා පෝෂණය කිරීම | | 4.1 ඉන්දියානු ජාතික නිදහස් සටන් ව්‍යාපාරය පැහැදිලි කරයි |

# Draft

## විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය පිළිබඳ ව අධ්‍යයනය කර තම රටේ ස්වාධීනත්වය රැක ගැනීමට කටයුතු කරයි | 1.1 මුහුදුබඩ පළාත්වල ලන්දේසි ක්‍රියාකාරිත්වය විමසා බලයි | 1. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම<br>1.1 මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවා ගැනීම<br>• ලන්දේසින් උඩරට රාජ්‍යය සමඟ පැවැත්වූ සම්බන්ධතා<br>1.2 ලන්දේසින්ගේ පාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික කටයුතු | • ලන්දේසීන් මුහුදුබඩ පළාත් අල්ලාගත් ආකාරය විස්තර කරයි<br>• ලන්දේසීන්ට අයත් ප්‍රදේශ සිතියමක ලකුණු කරයි<br>• උඩරට රාජ්‍යය හා ලන්දේසින් අතර ගැටුම්වලට හේතු හඳුනා ගනියි<br>• නම්‍යශීලීත්වය මඟින් ගැටුම් අවමකර ගත හැකි ආකාරය හදාරයි<br>• මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය පැවති ආකාරය විස්තර කරයි<br>• ලන්දේසීන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික කටයුතු පැහැදිලි කරයි<br>• ලන්දේසි පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි | 10 |

# Draft

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය පිළිබඳ ව අධ්‍යයනය කර තම රටේ ස්වාධිපත්‍යය රැකගැනීමට කටයුතු කරයි | 2.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පිහිටවූ ආකාරය පෙන්වා දෙයි | **2. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය**<br>2.1 ශ්‍රී ලංකාවට බ්‍රිතාන්‍යයන් පැමිණීම සහ බලය තහවුරු කර ගැනීම<br>• මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම<br>• 1815 දී උඩරට අල්ලා ගැනීම<br>• 1818 නිදහස් සටන<br>• 1848 නිදහස් සටන | • බ්‍රිතාන්‍ය ආධිපත්‍යය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීමට හේතු පැහැදිලි කරයි<br>• ස්වදේශීය විරෝධතා සහ ඒවායේ ස්වරූපය පහදයි<br>• තම ස්වාධිපත්‍යය රැක ගැනීමට සටන් මෙහෙයවූ නායකයන් අගය කරයි | 10 |
| ශ්‍රී ලාංකේය උරුමය රැකගැනීමට කටයුතු කරයි | 2.2 බ්‍රිතාන්‍ය පාලනය යටතේ ආර්ථික කටයුතු පැහැදිලි කරයි | 2.2 බ්‍රිතාන්‍යයන් යටතේ ඇති වූ ආර්ථික වර්ධනය<br>• වතු වගාව<br>• දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීම<br><br>**3. ශ්‍රී ලංකාවේ ආගමික සහ ජාතික පුනර්ජීවනය** | • වාණිජ භෝග වගාව ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරයි<br>• බ්‍රිතාන්‍යයන් යටතේ දේශීය කෘෂිකර්මාන්තය විස්තර කරයි<br>• බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් පෙන්වා දෙයි | 08 |

# Draft

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ඉන්දියාවේ විවිධ ජාතීන් ඉන්දියානුවන් ලෙස එක්සත් ව කටයුතු කළ ආකාරය ආදර්ශයට ගෙන ශ්‍රී ලාංකිකත්වය පිළිබඳ හැඟීමෙන් කටයුතු කරයි | 3.1 විදේශීය බලවේග හමුවේ දේශීය සංස්කෘතිය රැක ගත යුතු බව පෙන්වා දෙයි<br><br>4.1 ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ දී එරට ජනතාව එක්සත් ව කටයුතු කළ ආකාරය අධ්‍යයනය කරයි | • බෞද්ධ පුනරුදය<br>• හින්දු පුනරුදය<br>• ඉස්ලාම් පුනරුදය<br><br>4. ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය<br>• ඉන්දියාවේ යුරෝපීය බලපෑම්<br>• ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වීම<br>• ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය<br>• නිදහස් සටනේ කැපී පෙනුණු නායකයෝ | • ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය පැහැදිලි කරයි<br>• විදේශ බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙයි<br>• දේශීය සංස්කෘතිය රැකගැනීමට උරදුන් නායකයන් අගයයි<br><br>• අධිරාජ්‍යවාදීන් ඉන්දියාව තුළ බලය ව්‍යාප්ත කළ ආකාරය පැහැදිලි කරයි<br>• ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය විස්තර කරයි<br>• ඉන්දියානු ජාතික නිදහස් සටන් ව්‍යාපාරයෙහි දී විවිධ ජාතීන් එක්සත්ව කටයුතු කළ ආකාරය අගය කරයි<br>• ඉන්දියානු ජාතික නිදහස් ව්‍යාපාරය සමඟ බැඳුණු දේශප්‍රේමී චරිත ආදර්ශයට ගනියි | 10 |

# Draft

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනය සහ එහිලා දේශීය නායකයන්ගේ දායකත්වය විමර්ශනය කර රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමට දායක වෙයි | 5.1 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය විමසා බලයි | 5. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය<br>• කෝල්බෲක් ප්‍රතිසංස්කරණ<br>• ශ්‍රී ලාංකිකයන්ගේ ආණ්ඩුක්‍රම උද්ඝෝෂණ<br>• 1910 මැකලම් ප්‍රතිසංස්කරණ<br>• 1919 ජාතික සංගමය<br>• 1920,24 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>• ඩොනමෝර් ප්‍රතිසංස්කරණ<br>• සෝල්බරි ප්‍රතිසංස්කරණ | • බ්‍රිතාන්‍යයන් යටතේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පැහැදිලි කරයි<br>• ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සඳහා ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වය පෙන්වා දෙයි<br>• ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය ක්‍රමික විකාශනයක් බව පෙන්වා දෙයි | 10 |
| නිදහසින් පසු ලැබූ ජයග්‍රහණ අගයමින් යහපත් පුරවැසියකු ලෙස රටේ සංවර්ධනයට දායක වෙයි | 6.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික සංවර්ධනය අධ්‍යයනය කරයි | 6. නිදහසින් පසු ශ්‍රී ලංකාව<br>• නිදහසින් පසු බලයට පත්වූ ආණ්ඩු<br>• බලයට පත්වූ ආණ්ඩුවල වැඩපිළිවෙළවල්<br>• ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ<br>- 1972<br>- 1978<br>• ආර්ථික සංවර්ධනය හා සමාජ සුභසාධනය | • නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික කටයුතු විස්තර කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සුභසාධන කටයුතු පැහැදිලි කරයි<br>• නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු පෙන්වා දෙයි | 10 |

# Draft

**(ඇ) පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්**

ඉතිහාසය විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු සාර්ථක ව හා ඵලදායී ලෙස අධ්‍යයනය කිරීම සඳහාත් එ මඟින් ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීම සඳහාත් ශිෂ්‍ය සහභාගිත්වය වර්ධනය වන ආකාරයට පාසල් වැඩ සටහන් සම්පාදනය කර ගැනීම ඒවා අතිශයින් ම ප්‍රයෝජනවත් විය යුතුය.

මෙහි යෝජනා කොට ඇත්තේ එවැනි පාසල් වැඩ සටහන් කිහිපයක් පමණි. මේ අනුව වෙනත් නිර්මාණාත්මක වැඩ සටහන් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ නිදහස ඉතිහාසය උගන්වන ගුරුවරයාට හිමි වන බව සලකන්න.

- ඉතිහාස සංගමයක් පිහිටුවීමෙන් සිසු දැනුම ප්‍රවර්ධනය සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, විවාද, ප්‍රදර්ශන පැවැත්වීමත්, සඟරා, බිත්ති පුවත්පත් නිර්මාණය කිරීමත් වැනි කාර්යයන්ට සිසුන් යොමු කළ හැකිය.

- යටත් පිරිසෙන් වසරකට වරක් වත් වැදගත්කමකින් යුතු ස්ථානයකට හෝ ප්‍රදේශයකට හෝ අධ්‍යාපන චාරිකා සංවිධානය කළ යුතු ය. පන්ති කාමරයේ දී ලබා ගත් දැනුම තහවුරු කර ගැනීමට හා වර්ධනය කර ගැනීමට හැකි වන පරිදි පෙර සැලසුමකින් යුතු ව අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම වැදගත් වේ.

- දිවයිනේ පිළිගත් ඉතිහාසඥයන් පාසලට කැඳවා ඔවුන්ගේ අත්දැකීම් බෙදා හදා ගැනීමට සම්මන්ත්‍රණ මඟින් අවස්ථා ව සැලසිය හැකි ය.

- ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ස්මාරක පිළිබඳ ව සොයා බැලීම හා ඒවා ආරක්ෂා කිරීම සඳහා පාසල් හා ප්‍රජා  වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පුළුවන.

- ඉතිහාස පාඩම්වලට අදාළ වන චිත්‍ර, මූර්ති, කැටයම් හා වෙනත් කෞතුක වස්තු නිරීක්ෂණය කිරීමටත්, නිරීක්ෂණ වාර්තා සැපයීමටත් හැකි වන පරිදි කෞතුකාගාර වැඩසටහන් සංවිධානය තළ හැකිය.

- ඉතිහාස පාඩමට අදාළ ව අන්තර්ජාලය භාවිත කරමින් තොරතුරු ලබා ගැනීම සඳහා සිසුන් යොමු කළ යුතු ය.

Draft

**(ඇ) ඇගයීම සහ තක්සේරුකරණය**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මඟින් අපේක්ෂිත ඵල සිසුන් විසින් සාත්ෂාත් කර ගනු ලැබීම සහ තහවුරු කිරීම සඳහාත් සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් හඳුනා ගැනීම සඳහාත් පන්ති කාමරයේ පහසුවෙන් ක්‍රියාත්මක කළ හැකි අන්තර් සම්බන්ධතාවකින් යුත් වැඩ සටහන් දෙකක් ලෙස තක්සේරුව සහ ඇගයීම හඳුන්වා දිය හැකි ය.තක්සේරුව නිසි පරිදි සිදුවන්නේ නම් පන්තියේ ඉගෙනුම ලබන සිසුන්ට අපේක්ෂිත නිපුණතාවලට අදාළ ආසන්න ප්‍රවීණතා ලබා ගැනීම අපහසු නොවේ. ඇගයීමෙන් අපේක්ෂා කරන්නේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් කවරේ දැයි හඳුනා ගැනීමය.

තක්සේරුවෙහි යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙආකාරයකින් මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය.එ නම් ප්‍රතිපෝෂණ (Feed Back) ඉදිරි පෝෂණ (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා සහ දුබලතා අනාවරණය කර ගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්ය භාරය වේ.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා විෂය නිපුණතා අතුරෙන් කවර නිපුණතා කවර මට්ටමින් සාක්ෂාත් කරගත හැකි වූයේ දැයි සිසුන් විසින් හඳුනා ගනු ලැබීම අවශ්‍ය වේ.ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කර ගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වේ.



ඔබ වෙත ඉදිරිපත් කරන මෙම විෂයමාලාව ශිෂ්‍ය කේන්ද්‍රිය නිපුණතා පාදක ක්‍රියාකාරකම් දිශාභිමුඛ කරගත් ප්‍රවේශයකින් යුක්ත වේ. ක්‍රියාවෙන් ඉගෙනුම සඳහා සිසුන් යොමු කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කරන කාර්යය වේ.සිසුන් ක්‍රියාකාරකම්වල නියැළෙන විට හා එය අවසානයේ දී තක්සේරුව හා ඇගයීම සිදු කළ හැකි වේ.

තක්සේරුව හා ඇගයීම පහසුවෙන් සිදු කළ හැකි වන පරිදි ඒ සඳහා පොදු නිර්ණායක පහක් යෝජනා කෙරේ.මේ අතුරෙන් පළමු නිර්ණායක තුන නිපුණතාව ගොඩනැගීමට ඒකරාශි වී තිබෙන දැනුම,කුසලතා සහ ආකල්ප මූලික කොටගෙන සැකසී තිබේ. අවසාන නිර්ණායක දෙක ජීවිතයට වැදගත් වන හැකියා වර්ධනයට උපකාරී වන අයුරින් සැකසිය යුතු ය. මේ නිර්ණායක හා සම්බන්ධ චර්යා වෙනස්කම් පන්ති කාමරය තුළ දී සිසුන් ක්‍රියාත්මක වීමේදී හඳුනා ගැනීමට ගුරුවරයා උත්සාහ කළ යුතු තක්සේරුව යටතේ එම චර්යා ශක්තිමත් කිරීමටත් ඇගයීම යටතේ ඒවා ප්‍රමාණය කිරීමටත් ගුරුවරයා යොමු විය යුතු ය. මීට අමතරව පන්ති කාමරය තුළ ලිඛිත පරීක්ෂණ, ව්‍යාපෘති ආදියටත් මාසික. වාර සහ වසර අවසානයේ පවත්වනු ලබන පාසල් මට්ටමේ හෝ කලාපීය මට්ටමේ හෝ ලිඛිත පරීක්ෂණවලටත් සිසුන් ඉදිරිපත් කළ හැකි ය.

**9.1 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම**

16වන සියවස ආරම්භයේ දී මෙරටට පැමිණි පෘතුගීසීහු එම ශතවර්ෂයේ අවසානය වන විට දිවයිනේ මුහුදුබඩ ප්‍රදේශ රැසක තම බලය පිහිටුවා ගැනීමට සමත් වූහ. මෙසේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගත් පෘතුගීසීන් උඩරට රාජධානිය ද යටත් කර ගැනීමේ අරමුණින් වරින් වර උඩරට ආක්‍රමණය කිරීම නිසා උඩරට රජවරු පෘතුගීසීන් මෙරටින් නෙරපා හැරීමට ලන්දේසි සහය ලබා ගැනීමට ක්‍රියා කළහ. ලන්දේසීන් ද පෘතුගීසීන් මෙන් වෙළෙඳාම පිළිබඳ උනන්දුවක් දැක්වූ ජාතියකි. පෘතුගීසීන් ආසියාවට පැමිණ ශතවර්ෂයක් පමණ ගත වන විට ලන්දේසීහු ද වෙළෙඳ ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා ආසියාවට පැමිණියහ. ලන්දේසීන් තම වෙළෙඳ කටයුතු ශක්තිමත් ව හා ක්‍රමානුකූල ව පවත්වාගෙන යාම සඳහා VOC සමාගම (පෙරදිග ඉන්දියා එක්සත් වෙළෙඳ සමාගම) නමින් ඉතා ශක්තිමත් වෙළෙඳ සමාගමක් පිහිටුවා ගෙන තිබිණි. ලන්දේසීන් වෙනුවෙන් ආසියාවේ දේශපාලන බලය පැතිරවීම හා වෙළෙඳ කටයුතු පවත්වා ගෙන යාම සිදු කරන ලද්දේ මෙකී වෙළෙඳ සමාගම විසිනි. ලන්දේසීන් ආසියාවට පැමිණෙන තෙක් ගත වූ ශතවර්ෂයක පමණ කාලයේ දී පෘතුගීසීන්ගේ ආසියාතු වෙළෙඳ ආධිපත්‍යයට වෙනත් යුරෝපා ජාතියකගෙන් තර්ජනයක් නොතිබිණි. එහෙත් ලන්දේසීන් පැමිණීමත් සමඟ ආසියාවේ වෙළෙඳ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පෘතුගීසි, ලන්දේසි දෙපක්ෂය අතර නිරායාසයෙන් ගැටුම් ඇති විය. මේ නිසා ශ්‍රී ලංකාවෙන් පෘතුගීසීන් පලවා හැරීමට ලන්දේසි සහය ලබා ගැනීමට උඩරට රජවරු ක්‍රියා කළහ. උඩරට රාජ්‍යය සමඟ ලන්දේසීන් පැවැත්වූ සබඳතා සහ ලන්දේසි පාලන සමය තුළ මෙරට ඇතිවූ සමාජ, ආර්ථික සහ සංස්කෘතික සබඳතාවල ස්වරූපය පිළිබඳ ව අධ්‍යයනය කිරීම මෙම ඒකකය මගින් අපේක්ෂිතය.

**නිපුණතාව** : ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය පිළිබඳ ව අධ්‍යයනය කර තම රටේ ස්වාධිපත්‍ය රැක ගැනීමට කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 1.1 මුහුදුබඩ පළාත්වල ලන්දේසි ක්‍රියාකාරිත්වය විමසා බලයි

**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් පල** :
- ලන්දේසීන් මුහුදුබඩ පළාත් අල්ලාගත් ආකාරය විස්තර කරයි
- ලන්දේසීන්ට අයත් ප්‍රදේශ සිතියමක ලකුණු කරයි
- උඩරට රාජ්‍යය හා ලන්දේසීන් අතර ගැටුම්වලට හේතු පැහැදලි කරයි
- නම්‍යශීලීත්වය මගින් ගැටුම් අවම කර ගත හැකි ආකාරය හඳාරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන් යටතට පත්වීම**

- **මුහුදුබඩ පළාත්වල ලන්දේසි බලය පිහිටුවීම**
    - ලන්දේසීන් පෙරදිගට පැමිණීම (වර්ෂ 1595 සිට ලන්දේසීන් ආසියාවට පැමිණීම, 1602 දී VOCසමාගම පිහිටුවීම, ආසියාවේ ලන්දේසි බලයක් ගොඩනැගීම)
    - උඩරරට රජවරු ලන්දේසි සහය සොයා යාම (පළමුවෙනි විමලධර්මසූරිය රාජ්‍ය සමයේ ලන්දේසි දූතයන් උඩරටට පැමිණීම, සෙනරත් රජු ලන්දේසි ආධාර ලබා ගැනීමට ප්‍රයත්න දැරීම)
    - දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර ගිවිසුම වර්ෂ 1638 (දෙවන රාජසිංහ රජු හා ලන්දේසීන් අතර සබඳතා, 1638 ගිවිසුම, ගිවිසුමේ මූලික කරුණු)

- පෘතුගීසීන් නෙරපීමේ සටන් (ත්‍රිකුණාමලය, මීගමුව, ගාල්ල, කළුතර, කොළඹ ආදි බලකොටු යටත් කිරීම, පෘතුගීසින් පරාජය කිරීම)
- මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි බලය පිහිටුවීම (අල්ලාගත් බලකොටු ලන්දේසීන් යටතේ තබා ගැනීම, රජු හා ලන්දේසි අතර මතභේද ඇති වීම, ලන්දේසින් මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම)

- **ලන්දේසීන් උඩරට රාජ්‍යය සමඟ පැවැත්වූ සම්බන්ධතා**

    - දෙවෙනි රාජසිංහ රජු හා ලන්දේසීන් අතර සම්බන්ධතා ( රජු හා ලන්දේසීන් අතර ගැටුම් ඇතිවීම, රජු උඩරට බලය පැතිරවීම)
    - උඩරට ලන්දේසි දූත සම්බන්ධතා (දූත ගමන්, ලිපි හුවමාරුව, තෑගි බෝග හුවමාරුව)
    - සාමකාමී ප්‍රතිපත්තිය හා ගැටුම්වලින් වැළකීම (දෙවන විමලධර්මසූරිය රජුගේ සාමකාමී ප්‍රතිපත්තිය, උඩරට රජුගේ ආගමික හා සංස්කෘතික කටයුතුවලට ලන්දේසි සහය ලබා දීම)
    - ලන්දේසීන් උඩරට ආක්‍රමණය කිරීම (18 වන සියවසේ අග උඩරට ලන්දේසි මත ගැටුම්, කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ ලන්දේසි ආක්‍රමණය)

**නිපුණතා මට්ටම : 1.1 මුහුදුබඩ පළාත්වල ලන්දේසි ක්‍රියාකාරිත්වය විමසා බලයි**

**කාලච්ඡේද : 05**


**ඉගෙනුම් පල :**
- මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසි පාලනය පැවති ආකාරය විස්තර කරයි
- ලන්දේසීන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික කටයුතු පැහැදිලි කරයි
- ලන්දේසි පාලනය යටතේ ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග පෙන්වා දෙයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**1.2 ලන්දේසීන්ගේ පාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතු**

- **ලන්දේසි පාලන සංවිධානය**
  - VOC සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය, බතාවිය / බතාවියේ පෙරදිග ලන්දේසි මූලස්ථානය,
  - මෙරට ලන්දේසි ආණ්ඩුකාවරයා
  - ලන්දේසි පරිපාලන ව්‍යුහය, කොමාන්ඩරිවලට බෙදීම, ප්‍රාදේශීය පරිපාලනය හා නිලධාරීහු, අධිකරණ ප්‍රතිපත්තිය
- **ලන්දේසීන්ගේ ආර්ථික කටයුතු**
  - සමාගමට උපරිම ලාභ ලබා ගැනීමේ වෙළෙඳ ප්‍රතිපත්තිය
  - කෘෂිකාර්මික කටයුතු
  - තෝම්බු පවත්වාගෙන යාම
- **සමාජ හා සංස්කෘතික කටයුතු**
  - ආගමික ප්‍රතිපත්තිය
  - අධ්‍යාපන කටයුතු
  - ලන්දේසි සංස්කෘතිකාංග මෙරට පැතිරීම


යොමුව
ලන්දේසි පාලනය යටතේ පැවති ප්‍රදේශ
කොමාන්ඩරි සීමා
යාපනය
යාපනය කොමාන්ඩරි
වන්නි
මන්නාරම
ත්‍රිකුණාමලය
කල්පිටිය
පුත්තලම
මඩකලපුව
හලාවත
මහනුවර
රාජධානිය
මීගමුව
කොළඹ
කොළඹ කොමාන්ඩරිය
කළුතර
පානම
ගාලු කොමාන්ඩරි
හම්බන්තොට
ගාල්ල
මාතර
0 10 20 40
කිලෝමීටර
79°30'0"E
80°0'0"E
80°30'0"E
81°0'0"E
81°30'0"E
82°0'0"E
9°30'0"N
9°0'0"N
8°30'0"N
8°0'0"N
7°30'0"N
7°0'0"N
6°30'0"N
6°0'0"N

**ක්‍රියාකාරකම - 01**

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පවත්වන්න**

- පන්තිය සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ඇමුණුම 1 මාතෘකා කණ්ඩායම් අතර බෙදා දෙන්න.
- එක් එක් කණ්ඩායමට තමා ලද මාතෘකාව අනුව ප්‍රශ්න හා පිළිතුරු සැකසීමට උපදෙස් දෙන්න.
- ඒ ඒ කණ්ඩායම් සකස් කළ ප්‍රශ්න හා පිළිතුරු එක් රැස් කර ගොනු කර ගන්න.
- සුදුසු ලකුණු ක්‍රමයක් අනුගමනය කරමින් ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන් පවත්වන්න.

ඇමුණුම 01

ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සඳහා උපදෙස්

- මුහුදුබඩ ප්‍රදේශ ලන්දේසීන්ට අයත් වීම
- ලන්දේසින් හා උඩරට රාජධානිය
- ලන්දේසින්ගේ පාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික කටයුතු

**ඇගයීම සහ තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම සහ තක්සේරුව සිදු කරන්න**

- ශ්‍රී ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි.
- මාතෘකාවට උචිත ප්‍රශ්න හා පිළිතුරු සකස් කරයි.
- ප්‍රශ්න නිවැරදි ව සකස් කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන මෙහෙයවයි.

**ක්‍රියාකාරකම 02**

**ලන්දේසි පාලනය මඟින් ශ්‍රී ලාංකික සමාජයට එකතු වූ නවාංග පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමද සිදුකරන්න**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- ලන්දේසි පාලනය යටතේ මෙරට සංස්කෘතියට එකතු වූ නවාංග පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (වචන, ඇඳුම් පැලඳුම්, ආහාර පාන, භාණ්ඩ ආදී ...)
- ක්‍රියාකාරකමට අවශ්‍ය පින්තූර හා වෙනත් තොරතුරු රැස් කර ගැනීම සඳහා සතියකට පමණ පෙර සිසුන් දැනුම්වත් කරන්න.
- ක්‍රියාකාරකම සිදු කරන දිනයේ දී සිසුන් රැස් කරගෙන ආ පින්තූර හා තොරතුරු වර්ග කරන්න.
- එක් එක් කණ්ඩායම්වලට ඒවා බෙදා දී ක්‍රියාකාරකමේ නිරත කරවන්න.

- එක් එක් කණ්ඩායම් විසින් අදාල මාතෘකා පින්තූර සහ ලිපි ඇලවීමට උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම අවසන් කළ පසු කණ්ඩායම්වලට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී ප්‍රබලතා, දුබලතා පෙන්වා දෙන්න
- කණ්ඩායම් අතරින් වඩාත් නිවැරදි ක්‍රියාකාරකම තෝරා පන්තියේ ප්‍රදර්ශනයට තබන්න.
- දිනය පිළිබඳ ව දැනුවත් කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- ලන්දේසි පාලන සමය පිළිබඳ තොරතුරු ඇතුළත් වෙනත් මූලාශ්‍රය
- **පින්තූර**
- පුවත්පත්වල පින්තූර හා ලිපි වර්ග, ඩිමයි කඩදාසි
- ප්ලැටිග්නම්
- ගම්

ඇමුණුම 1

ලන්දේසින්ගෙන් මෙරටටඑක්වූ නවාංග පිළිබඳ ඔබ කණ්ඩායම රැස්කරගත් තොරතුරු, පින්තූර නිර්මාණශීලීව ප්‍රදර්ශනය කිරිම සඳහා සුදුසු ලෙස සකස් කරන්න.

කණ්ඩායම 1 - ලන්දේසිභාෂාවෙන් එකතු වූ නවාංග

කණ්ඩායම 2 - ඇඳුම් පැලඳුම්

කණ්ඩායම 3 - ආහාර පාන

කණ්ඩායම 4 - ගෘහ භාණ්ඩ

### 9.2 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය

වර්ෂ 1796 දී ලන්දේසීන් පරාජයට පත් කළ ඉංග්‍රීසීහු මෙරට මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කර ගෙන වර්ෂ 1815 දී උඩරට රාජධානියත් යටත් කළහ. එතැන් සිට වර්ෂ 1948 දක්වා වසර 133ක සමස්ත දිවයින ම බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවතිණි. මේ නිසා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පැවති කාලය මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ අවධිය හා සමස්ත දිවයින ම පාලනය කළ අවධිය වශයෙන් කාලපරිච්ඡේද දෙකකට අයත් වේ. ශ්‍රී ලංකාවේ යුරෝපීය බලපෑම් පැවති අවධිය හා සලකා බලන විට බ්‍රිතාන්‍ය පාලන සමය මෙරට ඉතිහාසයේ ප්‍රබල වෙනස්කම් ඇති වූ කාල පරිච්ඡේදයක් හැටියට ද සැලකිය හැකිය. බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණීම හා මුහුදු බඩ ප්‍රදේශ අත්පත් කර ගැනීම, උඩරට රාජධානිය යටත් කර ගැනීම 1818 හා 1848 යන වසරවල බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව ඇති වූ සටන්, බ්‍රිතාන්‍ය පාලනය සහ මෙරට ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් ආදිය ගැන මෙම ඒකකයේ දී අවධානය යොමු කෙරේ.

**නිපුණතාව** : ශ්‍රී ලංකාවේ විදේශාධිපත්‍යය පිළිබඳ අධ්‍යයනය කර තම රටේ ස්වාධිපත්‍ය රැක ගැනීමට කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 2.1 ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පිහිටවූ ආකාරය පෙන්වා දෙයි

**කාලච්ඡේද** : 05

**ඉගෙනුම් පල** :

- බ්‍රිතාන්‍ය ආධිපත්‍යය ශ්‍රී ලංකාවේ ස්ථාපිත වීමට හේතු පැහැදිලි කරයි
- ස්වදේශීය විරෝධතා සහ ඒවායේ ස්වරූපය පහදයි
- තම ස්වාධිපත්‍යය රැක ගැනීමට සටන් මෙහෙයවූ නායකයන් අගය කරයි

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

2.1 **බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට පැමිණීම හා බලය තහවුරු කර ගැනීම**

- **ඉංග්‍රීසීන් මුහුදුබඩ ප්‍රදේශ යටත් කර ගැනීම**
  - ශ්‍රී ලංකාව කෙරෙහි බ්‍රිතාන්‍යයන්ගේ අවධානය යොමුවීමට බලපෑ හේතු
  - වර්ෂ 1796ට පෙර ඉංග්‍රීසීන් හා උඩරට රාජධානිය අතර පැවති සම්බන්ධතා
  - පෙරදිග ඉන්දියා ඉංග්‍රීසි වෙළෙඳ සමාගම මෙරට මුහුදුබඩ ප්‍රදේශවල බලය පිහිටුවීම
  - වර්ෂ 1797 මුහුදුබඩ ප්‍රදේශවල කැරැල්ල

- **උඩරට රාජධානිය යටත් කර ගැනීම**
  - වර්ෂ 1803 උඩරට ආක්‍රමණය
  - තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා හා ජෝන් ඩොයිලි
  - උඩරට රාජධානියේ අභ්‍යන්තර බල අරගල
  - වර්ෂ 1815 උඩරට ආක්‍රමණය හා රජු අත් අඩංගුවට ගැනීම

- **1818 නිදහස් සටන**
  - සටනට තුඩු දුන් හේතු
  - ඉංග්‍රීසි විරෝධී සටන හා නායකයෝ
  - සටන අසාර්ථක වීම හා ප්‍රතිඵල

- 1848 නිදහස් සටන

  - සටන් ඇතිවීමට බලපෑ හේතු
  - සටන හා නායකයෝ
  - සටන අසාර්ථක වීම හා ප්‍රතිඵල

**ඉහත විෂය කරුණු ආවරණය වන සේ පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

**ක්‍රියාකාරකම 01**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න.
- ඇමුණුම 01හි ඇතුළත් ප්‍රශ්න සිසුන්ට අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

| **ඓතිහාසික සිදුවීම්** | **සම්බන්ධ පුද්ගලයන්** |
|---|---|
| 1. කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි දූතයා කවරෙක්ද? | ____________ |
| 2. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශය යටත් කර ගනිද්දී උඩරට පාලනය කළ නායක්කර් වාංශික රජතුමා කවරෙක්ද? | ____________ |
| 3. 1798 දී මෙරටට පත්වූ ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා කවරෙක්ද? | ____________ |
| 4. මේට්ලන්ඩ් ආණ්ඩුකාරයා හා එක් ව උඩරට රාජධානිය පිළිබඳ තොරතුරු රැස් කළ බ්‍රිතාන්‍ය නිලධාරියා කවරෙක්ද? | ____________ |
| 5. 1815 උඩරට යටත් කර ගත් ඉංග්‍රීසි ආණ්ඩුකාරයා වූයේ කවුද? | ____________ |
| 6. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයන් යටතට පත්වන අවධියේ උඩරට පාලනය කළ රජතුමා කවරෙක්ද? | ____________ |
| 7. 1818 පළමු නිදහස් සටනට නායකත්වය දුන් නායකයකු වූයේ | ____________ |
| 8. 1833 මෙරට ක්‍රියාත්මකවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කළේ කවරෙක්ද ? | ____________ |
| 9. 1848 දෙවන නිදහස් අරගලය සමයේ මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා කවරෙක්ද? | ____________ |
| 10. දෙවන නිදහස් සටනේ නායකයකු ලෙස කටයුතු කළ අයෙකි | ____________ |

(ජෝන් පයිබස්, ටොරින්ටන් සාමි, රොබට් බ්‍රවුන්රිග්, ශ්‍රී වික්‍රම රාජසිංහ, ෆෙඩ්රික් නෝර්ත්, කෝල්බෘක් කැප්පෙටිපොළ, ජෝන් ඩොයිලි, රාජාධිරාජසිංහ, පුරන් අප්පු)

ක්‍රියාකාරකමට පහළ ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පිරවීමට උපදෙස් දෙන්න.

**නිපුණතා මට්ටම :** 2.2 බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථික කටයුතු පැහැදිලි කරයි.

**කාලච්ඡේද :** **05 යි**

**ඉගෙනුම් පල :**
- වාණිජ බෝග වගාව ව්‍යාප්ත වූ ආකාරය පැහැදිලි කරයි.
- බ්‍රිතාන්‍යයන් යටතේ දේශීය කෘෂිකර්මාන්තය විස්තර කරයි.
- බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට ඇතිවූ වෙනස්කම් පෙන්වා දෙයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කර ගන්න**

**2.2 බ්‍රිතාන්‍යයන් යටතේ ඇතිවූ ආර්ථික වර්ධනය**

- **වතු වගාව**
  - බ්‍රිතාන්‍යයන් වතු වගාව ආරම්භ කිරීමට පෙර මෙරට පැවති ආර්ථික තත්ත්වය
  - බ්‍රිතාන්‍යයන් වතු වගාව කෙරෙහි යොමු වීම
  - රජයේ ආදායම වැඩි කර ගැනීම
    - * රජයේ ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය
    - * දේශීය හා විදේශීය පෞද්ගලික ව්‍යවසායකයන්ට ඉඩම් මිල දී ගැනීමට හැකි වීම
    - * පෞද්ගලික ව්‍යවසායකයන්ට ගැළපෙන පරිදි නීති රීති සකස් කිරීම

- **වතු වගාවේ දියුණුව**
  - කෝපි
  - සිංකෝනා හා කොකෝවා
  - තේ
  - පොල්
  - රබර්

- **දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීම**
  - බ්‍රිතාන්‍යයන් යටතේ දේශීය කෘෂිකර්මාන්තය පරිහානියට පත් වීම
  - බ්‍රිතාන්‍යයන් දේශීය කෘෂිකර්මාන්තය නගා සිටුවීමට උත්සාහ ගැනීම
    - * වැව් අමුණු ප්‍රතිසංස්කරණය
    - * වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම
    - * සමුපකාර සමිති පිහිටුවීම

**බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථිකය යන තේමාවට අදාළ විෂය කරුණු අනාවරණය වන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

**ක්‍රියාකාරකම 02**

- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- බ්‍රිතාන්‍යයන් යටතේ ආර්ථිකය පාඩම සිසුන් සමග සාකච්ඡා කර අවසානයේ දී ඇමුණුම 01 හි වගුව හුනු පුවරුවේ සටහන් කරන්න
- එහි A තීරුවේ සඳහන් වගන්ති පිළිබඳ සිසු අදහස් B තීරුවේ සටහන් කිරීමට අවස්ථාව ලබා දෙන්න. (අදහස් දැක්වීම කණ්ඩායම් ලෙස සිදු කිරීම ප්‍රමාණවත් වන අතර යම් කිසිවෙක් පෞද්ගලික මතයක් දරයි නම් ඊට ඉඩ ලබා දෙන්න)
- කණ්ඩායම් අදහස් දැක්වීමට අවධානය යොමු කරමින් පාඩම සමාලෝචනය කරන්න

**ගුණාත්මක යෙදවුම්**

**ඇමුණුම 01**

| A තීරුව (අදහස්) | B තීරුව (ප්‍රතිචාර) |
|---|---|
| 1. වතු වගාව හඳුන්වා දීම | ................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................ |
| 2. දේශීය කෘෂිකර්මාන්තය පරිහානියට පත්වීම | ................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................ |
| 3. දේශීය කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට උත්සාහ ගැනීම | ................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................<br>................................................................ |

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය පැහැදිලි කරයි
- බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදුවූ යහපත් හා අයහපත් ගුණාංග පෙන්වා දෙයි
- වගන්තිවලට අදාළ ව තොරතුරු ඉදිරිපත් කරයි
- කණ්ඩායමක් ලෙස කටයුතු කරයි
- නායකත්වය ගෙන කටයුතු කරයි

Draft



## 9.3 ශ්‍රී ලංකාවේ ආගමික හා ජාතික පුනර්ජීවනය

යුරෝපීයන් ආසියාවට පැමිණීමේ අරමුණු අතර ආගම පැතිරවීමේ අරමුණක් ද තිබිණි. මේ අනුව ආසියාවේ බලය ව්‍යාප්ත කරගෙන සිටි පෘතුගීසීහු තම බලපෑම් සහිත ප්‍රදේශවල රෝමානු කතෝලික ආගම පැතිරවූ ලන්දේසීහු රෙපරමාදු ආගම (ප්‍රොතෙස්තන්ත රෙපරමාදු) ව්‍යාප්ත කළහ. බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණි අවධිය වන විට යුරෝපයේ විවිධ මිශනාරි සංවිධාන බිහිවී යුරෝපයෙන් බැහැර ප්‍රදේශවල ස්වකීය ආගම් පැතිරවීම ගැන නව උනන්දුවක් ඇති වී තිබිණි. මේ අනුව බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී මෙරටට පැමිණි විවිධ මිශනාරි සංවිධානවල සාමාජිකයෝ ආගම පැතිරවීමේ කටයුතුවල නිරත වූහ. මිශනාරීන්ගේ ආගම පැතිරවීමේ ප්‍රචාරක කටයුතු නිසා මෙරට බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ආගම් ඇදහූ ජනතාව අතර ද, ආගමික ප්‍රබෝධයක් ඇති විය. 19 වන සියවස තුළ මෙරටට පැමිණි විවිධ මිෂනාරි සංවිධාන, ඒවායේ ආගමික ප්‍රචාරක ක්‍රම බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ආගමික පුනරුද ව්‍යාපාර, ආගමික පුනරුදය සමග දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීම පිළිබඳ ව ඇති වූ උනන්දුව වැනි මාතෘකා පිළිබඳ ව මෙම ඒකකය යටතේ අවධානය යොමු කෙරේ.

**නිපුණතාව** : ශ්‍රී ලාංකේය උරුමය රැක ගැනීමට කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 3.1 විදේශීය බලවේග හමුවේ දේශීයත්වය රැක ගත යුතු බව පෙන්වා දෙයි

**කාලච්ඡේද** : 08

**ඉගෙනුම් පල**

- ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය පැහැදිලි කරයි
- විදේශ බලවේග හමුවේ ජාතික නායකයන්ගේ ක්‍රියාකාරිත්වය පෙන්වා දෙයි
- දේශීය සංස්කෘතිය රැක ගැනීමට උරදුන් නායකයන් අගයයි.

**පාඩම සැලසුම සඳහා උපදෙස්**

**පහත සඳහන් විෂය කරුණු ඇසුරින් පාඩම සැලසුම් කර ගන්න**

- **මිශනාරි සංවිධාන හා ඒවායේ කටයුතු**
  - 19වන සියවස මුල් භාගයේ මෙරටට පැමිණි මිශනාරි සංවිධාන
  - මිශනාරි සංවිධානවල ආගමික ප්‍රචාරක කටයුතු

- **බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය**
  - නායකත්වය දුන් පිරිස හා ආයතන
  - මුද්‍රණාලය පිහිටුවීම හා මුද්‍රිත මාධ්‍ය යොදා ගැනීම
  - වාද විවාද
  - බෞද්ධ පාසල් පිහිටුවීම
  - දේශීය සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමේ මතවාද

- **හින්දු පුනර්ජීවන ව්‍යාපාරය**
  - නාවලර්තුමා හා හින්දු පුනරුදය
  - ලේඛන මාධ්‍ය
  - හින්දු පාසල් පිහිටුවීම
- **ඉස්ලාම් පුනර්ජීවන ව්‍යාපාරය**
  - අරාබි පාෂා හා ඇම්. සී. සිද්දි ලෙබ්බේ මහතා
  - ඉස්ලාම් අධ්‍යාපන ප්‍රබෝධය

**ක්‍රියාකාරකම 01**

**ඉහත විෂය කරුණු ආවරණයවන සේ පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න.**

- මෙය විනෝදාත්මක ක්‍රීඩාවක් වශයෙන් එළිමහනේ සිදු කළ හැකි ක්‍රියාකාරකමකි.
- ක්‍රියාකාරකමට සතියකට පමණ පෙර ජාතික හා ආගමික පුනරුදයේ නායකයන් පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට සූදානම්වන ලෙස උපදෙස් දෙන්න. ඒ සඳහා
  - කාලය මිනිත්තු 3 ක් බව
  - පෙළ පොත හා වෙනත් පොත්පත් පරිශීලනයෙන් තොරතුරු සපයා ගතයුතු බව
  - නියමිත දිනයේ තමාට ලැබෙන පුද්ගලයා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු බව දැනුවත් කරන්න.
- ඇමුණුම 01හි ඇතළලත් පුද්ගල නාම සඳහන් කර තුණ්ඩු සාදන්න.
- නියමිත දිනයේ සිසුන් එළිමහනකට ගෙන ගොස් පන්තිය රවුමට සකස් කර ගන්න.
- සංගීත තොප්පිය දැමීමේ ක්‍රියාකාරකම සිදු කරන්න.
- තොප්පිය අතේ හෝ හිසේ හෝ තිබෙන ශිෂ්‍යයා මැදට පැමිණ තෝරා ගන්නා ලද තුණ්ඩුවේ සඳහන් පුද්ගලයා පිළිබඳ කථාවක් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා දෙන්න.
- ඉදිරිපත් කරන ලද කථාව ඇසුරෙන් ප්‍රශ්න ඇසීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

අංක 1 ඇමුණුමේ සඳහන් නම් ලියන ලද තුණ්ඩු කැබලි
තොප්පියක්
දේශානුරාගී ගීතයක් සහිත කැසට් පටියක් හා යන්ත්‍රයක් (උදා:- හෙළ ජාතික අභිමානේ)

**ඇමුණුම අංක 1**

1. හෙන්රි ස්ටීල් ඕල්කොට් තුමා
2. අනගාරික ධර්මපාල තුමා
3. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි
4. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
5. අරුමුග නාවලර් තුමා
6. එම්. සී. සිද්දි ලෙබ්බේ තුමා

**සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදුකරන්න**

- ආගමික හා පුනර්ජීවන ව්‍යාපාරයේ නායකයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- කරුණු නිවැරදි ව ඉදිරිපත් කරයි.
- දේශීය නායකයන්ගේ සේවය අගය කරයි.
- කරුණු ගොනු කරලීමේ හා ඉදිරිපත් කිරීමේ කුසලතා පෙන්වයි.
- නියමිත කාලයට ඉදිරිපත් කිරීම අවසන් කරයි.

**ඇමුණුම (1)**

1. මහත්මා ගාන්ධි
2. දඩාභාගි නඩරෝජි
3. මවුලානා අබ්දුල් කලාම් අසාද්
4. සුරේන්ද්‍රනාත් බැනර්ජි
5. ජවහල්ලාල් නේරු

## 9.4 ඉන්දියානු නිදහස් සටන

වර්ෂ 1498 වස්කෝදගාමාගේ පැමිණීමත් සමඟ ඉන්දියාවේ යුරෝපා බල ව්‍යාප්තිය ආරම්භ විය. එතැන් සිට පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි හා ප්‍රංශ බලපෑම් ඉන්දියාව තුළ දක්නට ලැබිණි. ඉන්දියාව බ්‍රිතාන්‍ය බලයට යටත් වීමට පෙර මුගල් අධිරාජ්‍යය පැවතීම නිසා එරට තුළ යුරෝපීයයන්ගේ කටයුතු යම් පමණකට සීමා වී තිබිණි. එහෙත් 19වන සියවසේ මැද වන විට ඉන්දියාවේ විශාල ප්‍රදේශයක බලය ව්‍යාප්ත කර ගැනීමට ඉංග්‍රීසීහු සමත් වූහ. ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත්වීමෙන් පසුව 19 වන සියවස අග භාගයේ දී ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ කටයුතු ඇරඹිණි. 20 වන සියවසේ මුල් භාගය එම නිදහස් ව්‍යාපාරයේ ඉතාම ක්‍රියාකාරී අවධිය විය. විවිධ ජන වර්ගවලට අයත් වූ විවිධ භාෂා කථා කළ ඉන්දියානු ජනතාව මහත්මා ගාන්ධි ඇතුළු ඉන්දියානු නායකයන්ගේ මග පෙන්වීම යටතේ දැඩි දේශානුරාගයෙන් යුතු ව නිදහස් සටන මෙහෙයවීම සෙසු ආසියාතික යටත් විජිතවලට ද ආදර්ශයක් විය. මෙම පරිච්ඡේදයේ දී ඉන්දියාවේ යුරෝපීය බලපෑම් ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම නිදහස් සටන් ව්‍යාපාරය හා ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනුණ නායකයන් පිළිබඳ අවධානය යොමු කෙරේ.

**නිපුණතාව** : • ඉන්දියාවේ විවිධ ජාතීන් ඉන්දියානුවන් ලෙස එක්සත් ව කටයුතු කළ ආකාරය ආදර්ශයට ගෙන ශ්‍රී ලාංකිකත්වය පිළිබඳ හැඟීමෙන් කටයුතු කරයි

**නිපුණතා මට්ටම** : 4.1 ඉන්දියානු නිදහස් ව්‍යාපාරයේ දී එරට ජනතාව එක්සත් ව කටයුතු කළ ආකාරය අධ්‍යයනය කරයි

**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් ඵල** :

- අධිරාජ්‍යවාදීන් ඉන්දියාව තුළ බලය ව්‍යාප්ත කළ ආකාරය පැහැදිලි කරයි.
- ඉන්දියානු නිදහස් සටන් ව්‍යාපාරය විස්තර කරයි
- ඉන්දියානු ජාතික නිදහස් සටන් ව්‍යාපාරය තුළ විවිධ ජාතීන් එක්සත් ව කටයුතු කළ ආකාරය අගය කරයි
- ඉන්දියානු ජාතික නිදහස් සටන් ව්‍යාපාරය සමඟ බැඳි දේශප්‍රේමී චරිත ආදර්ශයට ගනී

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරන්න**

- **ඉන්දියාව තුළ යුරෝපීය බලපෑම**
  - පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි හා ප්‍රංශ ජාතිකයන් ඉන්දියාවට පැමිණීම
  - ඉන්දියාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් වීම
- **වර්ෂ 1857 සිපොයි කැරැල්ල**
  - * කැරැල්ලට බලපෑ හේතු
  - * කැරැල්ලේ ස්වරූපය
  - * ප්‍රතිඵල
- **ඉන්දියානු නිදහස් සටනේ කැපීපෙනෙන ලක්ෂණ**
  - ජාතික සංගමය බිහිවීමේ පසුබිම
  - ජාතික සංගමයේ අරමුණු
  - ජාතික සංගමයේ ක්‍රියාකාරිත්වය
  - මුස්ලිම් ලීගය පිහිටුවීම

- ඉංග්‍රීසීන් අනුගමනය කළ උපක්‍රම
- මහත්මා ගාන්ධිගේ කටයුතු
- ඉන්දියාවට නිදහස ලැබීම

- **ඉන්දියානු නිදහස් සටනේ කැපී පෙනුණ නායකයෝ**
  - දඩාභාගි නඩරෝජි
  - සුරේන්ද්‍රනාත් බැනර්ජි
  - බාල් ගංගාධාර් තිලක්
  - මහත්මා ගාන්ධි
  - මවුලානා අබ්දුල් කලාම් අසාද්
  - ජවහල්ලාල් නේරු

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

**ක්‍රියාකාරකම** 01


- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01 කණ්ඩායම්වලට ලබාදී තොරතුරු රැස් කිරීමට  කාලය ලබා දෙන්න
- ක්‍රියාකාරකම සඳහා සුදුසු දිනයක් තීරණය කර සිසුන්ට දැනුම් දෙන්න
- නියම කර ගත් දිනයේ දී ඇමුණුම 2 හා 3 කණ්ඩායම්වලට ලබා දෙන්න
- රැස් කර ගත් තොරතුරු, පින්තූර ආදිය උපයෝගි කර ගෙන ලබා දී ඇති උපදෙස් පරිදි ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න
- සිසු නිර්මාණ එකතු කර බිත්ති පුවත්පත නිර්මාණය කරන්න


**ගුණාත්මක යෙදවුම්**


ඇමුණුම 1හි සඳහන් පුද්ගල පින්තූර
ඕමයි කොළ
ප්ලැටිග්නම්
ගම්
පෙළ පොත
ඉතිහාස ධාරා පොත
වෙනත් පොත් හෝ සඟරා


| |
|---|
| **ඇමුණුම (1)**<br><br>මහත්මා ගාන්ධි<br>දඩාභායි නවරෝජි<br>මවුලානා අබුල් කලාම් අසාද්<br>සුරේන්ද්‍රනාත් බැනර්ජි<br>ජවහල්ලාල් නේරු |











ඇමුණුම (2)

ඇමුණුම (3)

**කණ්ඩායමට උපදෙස්**

- ඔබ වෙත සපයා ඇති පින්තූර අතරින් කරුණු සෙවීමට ඔබ කණ්ඩායමට පැවරූ පුද්ගලයාගේ පින්තූරය තෝරාගන්න.
- එය ඔබට සපයන ඩිමයි කොළයේ අලවන්න.
- එහි යටින් ඔහුගේ නම නිවැරදි ව ලියන්න.
- ඊට යටින් ඔබ ලබා ගත් තොරතුරු ලියන්න.

එයට නම, උපන් ප්‍රදේශය, සාමාන්‍ය ජීවන තොරතුරු, ඉන්දියානු නිදහස් සටනට දැක්වූ දායකත්වය හා ඔබට එම චරිතයෙන් ගත හැකි ආදර්ශ ලියන්න.

- ඔබේ පත්‍රිකාව පන්ති බිත්ති සඟරාවට එකතු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න.

- තොරතුරුවල නිවැරදි බව
- තොරතුරු ගවේෂණය කිරීමට විවිධ මාර්ග යොදා ගැනීම
- තොරතුරු සංවිධානාත්මක ව ගොනු කිරීම
- කාලය කළමණාකරණය
- සමස්ත නිමාව

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**

ඇමුණුම 01 හි ඇතුලත් කාර්ය පත්‍රිකාව අභ්‍යාස පොතේ සටහන් කර ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න

**ක්‍රියාකාරකම 2**

- මෙය කේවල ක්‍රියාකාරකමකි

- ඉන්දියානු ජාතික නිදහස් සටනේ අවස්ථා කීපයක් හා ආදර්ශ කීපයක් පහත දැක්වේ. ඒ ඒ අවස්ථා හා ආදර්ශ පිළිබඳ ඔබේ අදහස් ඉදිරියෙන් ඇති කඩ ඉරි මත ලියා දක්වන්න.

(1) එකමුතුකමේ අවශ්‍යතාව හා ජාතික සංගමය පිහිටුවීම ..............................................................
..............................................................
..............................................................
..............................................................

(2) ස්වදේශීය ව්‍යාපාරය ..............................................................
..............................................................
..............................................................

(3) අවිහිංසාවාදී ව්‍යාපාරය ..............................................................
..............................................................
..............................................................

(4) නොපසුබට අරමුණු කරා ළඟා වීම ..............................................................
..............................................................
..............................................................

(5) සහයෝගිතාවෙන් කටයුතු කර නිදහස ලබා ගැනීම ..............................................................
..............................................................
..............................................................
..............................................................
..............................................................

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**
**පහත සඳහන් නිර්ණායක ඇසුරින් ඇගයීම හා තක්සේරුව සිදු කරන්න**

- සරල ව හා නිවැරදි ව තොරතුරු ඉදිරිපත් කිරීම
- විචාරශීලී ව අදහස් ඉදිරිපත් කිරීම
- සමබර ව තොරතුරු ලිවීම
- ආකල්පීය තොරතුරු ලිවීම
- නියමිත කාලයට ක්‍රියාකාරකම අවසන් කිරීම

## 9.5 ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය

වර්ෂ 1815 දී උඩරට රාජධානිය බ්‍රිතාන්‍ය යටත් වීමත් සමඟ එතෙක් මෙරට පැවති රාජාණ්ඩු පාලන ක්‍රමය බිඳ වැටිණි. ඉන් පසුව 1948 වර්ෂයේදී ශ්‍රී ලංකාවට නිදහස ලැබෙන තෙක් සමස්ත දිවයින ම බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවතිණි. බ්‍රිතාන්‍යයන් විසින් 1833දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණය හඳුන්වා දෙන ලදි. එහෙත් පාලන කටයුතුවල දී ස්වදේශිකයන්ට වැඩි බලතල ලබා දෙන ලෙස ඉල්ලා ලාංකිකයෝ උද්ඝෝෂණ දියත් කළහ. එහි ප්‍රතිඵල ලෙස වරින් වර මෙරටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් හඳුන්වා ඒවායින් ද සෑහීමට පත් නොවූ ලාංකිකයෝ අඛණ්ඩ උද්ඝෝෂණ ව්‍යාපාරයක් දියත් කළහ. 1948 වර්ෂයේ දී ලංකාවට නිදහස ලබාගත හැකි වූයේ එම උද්ඝෝෂණවල ප්‍රතිඵලයක් ලෙසිනි. මෙම පරිච්ඡේදයෙන් බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ලාංකිකයන්ගේ උද්ඝෝෂණ ව්‍යාපාරය (ජාතික නිදහස් ව්‍යාපාරය) පිළිබඳ ව තොරතුරු සංක්ෂිප්ත ව සාකච්ඡා කෙරේ.

**නිපුණතාව** : ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනය හා එයට දේශීය නායකයන්ගේ දායකත්වය විමර්ශනය කර රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමට දායක වෙයි

**නිපුණතා මට්ටම** : 5.1 ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය විමසා බලයි

**කාලච්ඡේද** : 10

**ඉගෙනුම් පල** :
- බ්‍රිතාන්‍යයන් යටතේ මෙරට පැවති ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පැහැදිලි කරයි
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා ගැනීම පිළිබඳ ව ශ්‍රී ලාංකිකයන්ගේ දායකත්වය පෙන්වා දෙයි
- ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමය ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල ක්‍රමික විකාශනයක් බව පෙන්වා දෙයි

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම්කර ගන්න**

- **1833 කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ**
  - කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට තුඩුදුන් හේතු
    * වසරින් වසර ලංකාවේ ආදායම පහළ බසිමින් වියදම ඉහළ යාම
    * මෙරට වියදම පියවා ගැනීම සඳහා බ්‍රිතාන්‍යයෙන් වරින් වර මුදල් ඉල්ලීම

- **කෝල්බෲක් කොමිසමේ විමර්ශනයට ලක්වූ ක්ෂේත්‍ර**
  - ආණ්ඩුකාරවරයාගේ කටයුතු
  - ආදායම් හා වියදම් - ඩබ්. එම්. සී. කෝල්බෲක්
  - මෙරට පරිපාලන ආයතන
  - අධිකරණ ක්ෂේත්‍රය - චාල්ස් හේ කැමරන්

- **ක්‍රියාත්මක කරන ලද ප්‍රතිසංස්කරණ**
  - ව්‍යවස්ථාදායක සභාව හා විධායක සභාව පිහිටුවීම
  - උඩරට හා පහතරට ප්‍රදේශ ඒකාබද්ධ කොට රට එක්සේසත් කිරීම
  - පරිපාලන කටයුතු සඳහා මුළු රට ම පළාත් පහකට බෙදීම
  - අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
  - ඉංග්‍රීසි අධ්‍යාපනය පුළුල් කිරීම

- **ශ්‍රී ලාංකිකයන්ගේ උද්ඝෝෂණ**

  - කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ යම් යම් අංග සංශෝධනය කරන ලෙස ඉල්ලා මෙරට සිටි යුරෝපීය ව්‍යාපාරිකයන් මුල් වරට උද්ඝෝෂණ ආරම්භ කිරීම
  - 20වෙනි සියවස තුළ නැඟී ආ ලාංකික මධ්‍යම පන්තිකයන් මෙරටට ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය බවට ඉල්ලීම් ඉදිරිපත් කිරීම

- **කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ**

  - 1910 ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යවස්ථාදායක සභාව
  - ව්‍යවස්ථාදායක සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීමේදී පළමු වරට ඡන්ද බලය හඳුන්වා දීම
  - උගත් ලාංකිකයන් වෙනුවෙන් එක් නියොජිතයකු එම සභාවට පත්වීම
  - ජනවාර්ගික නියෝජන ක්‍රමය තව දුරටත් ක්‍රියාත්මක වීම

- **ලංකා ජාතික සංගමය**

  - ලංකාවේ මෙතෙක් පැවති සංවිධානවල එකතුවක් ලෙස 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවීම

- **ලංකා ජාතික සංගමයේ අරමුණු**

  - ලාංකිකයන්ට දේශපාලන බලතල ලබා ගැනීමට ශක්තිමත් උද්ඝෝෂණ මෙහෙය වීම
  - ව්‍යවස්ථාදායක බලතල පුළුල් කර ගැනීම
  - දේශීය නායකයන්ට පාලන කටයුතුවලට වැඩි වැඩියෙන් සම්බන්ධ වීමට අවස්ථාව ලබා ගැනීම
  - සිංහල, දෙමළ, මුස්ලිම් වැනි විවිධ ජන කොටස් නියෝජනය කළ සංවිධාන රැසක් පොදු අරමුණක් වෙනුවෙන් එකට එකතු වීම මෙරට ඉතිහාසයේ වැදගත් අවස්ථාවක් වීම
  - ලංකා ජාතික සංගමය අනුගමනය කළ ක්‍රියා මාර්ග

- **1920 මැනිං ප්‍රතිසංස්කරණය**

  - ව්‍යවස්ථාදායක සභාවේ පළමු වරට නිල නොලත් බහුතරයක් ඇතිවීම
  - පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය හඳුන්වා දීම

- **1924 මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණය**

  - ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය
  - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්ගේ බහුතරය සීමිත ඡන්දයෙන් පත් කළ අය වීම
  - ජනවාර්ගික නියෝජන ක්‍රමය තව දුරටත් ක්‍රියාත්මක වීම
  - 1920 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැවති ඡන්ද බලයේ කිසි දු වෙනසක් සිදු නොවීම

Draft


- **1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණය**

  - ඩොනමෝර් කොමිසම පත්වීම හා මෙරටට පැමිණීම

- **ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා**

  - රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
  - සර්ව ජන ඡන්ද බලය
  - විධායක කාරක සභා ක්‍රමය
  - ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිලධාරීන
  - ජනවාර්ගික නියෝජන ක්‍රමය අහෝසි කිරීම

- **1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ**

  - සෝල්බරි කොමිසම පත් කිරීම
  - සෝල්බරි කොමිසම මෙරට පැමිණීම හා නව ආණ්ඩු සැලසුම් කිරීම

- **සෝල්බරි ආණ්ඩුක්‍රමය**

  - අග්‍රාණ්ඩුකාර තනතුර
  - ද්විමණ්ඩල පාර්ලිමේන්තුව
  - අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
  - රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම

**ඉහත විෂය කරුණු ආවරණය වන පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම සිදු කරන්න**
**ක්‍රියාකාරකම 01**

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය යන පාඩම ඇසුරෙන් පහත 01 සඳහන් වගුව සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න
- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ශිෂ්‍යයන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න
- ඉහත පාඩම් පිළිබඳ ව පළමු ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න
- ඇමුණුම 01හි සඳහන් වගුව හුනු පුවරුවේ සටහන් කරන්න
- ඩිමයි කොළවල හෝ බ්‍රිස්ල් බෝඩ්වල හෝ එම වගුව පිටපත් කර ගන්නා ලෙස කණ්ඩායම්වලට උපදෙස් දෙන්න
- කණ්ඩායමේ සියලු දෙනා සමඟ සාකච්ඡා කරමින් වගුව සම්පූර්ණ කරන්න
- කණ්ඩායම් ක්‍රියාකාරකම් පන්තියට ඉදිරිපත් කරවන්න
- සිසු ඉදිරිපත් කිරීම්වල ඌන පූරණ සපයමින් හුණු පුවරුවේ වගුව සම්පූර්ණ කරන්න
- එම වගුව ශිෂ්‍ය අභ්‍යාස පොතේ සටහන් කරගැනීමට උපදෙස් දෙන්න

**ගුණාත්මක යෙදවුම්**

- බ්‍රිස්ල් බෝඩ්, ප්ලැටිග්නම්

ඇමුණුම 01

| වර්ෂය | ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය | ව්‍යවස්ථාදායකය හැඳින්වූ නම | ව්‍යවස්ථාදායකයට පත් කළ මන්ත්‍රී සංඛ්‍යාව | ප්‍රතිසංස්කරණයේ වැදගත්කම |
|---|---|---|---|---|
| | | | | |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න**

- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ නම් කරයි
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ තොරතුරු නිවැරදි ව වගු ගත කරයි
- ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කරයි
- නියමිත කාලයට කාර්යය කරයි
- කණ්ඩායම් සහයෝගයෙන් කටයුතු කරයි

**ඉහත සඳහන් විෂය කරුණු ආවරණය වන සේ පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න**

**ක්‍රියාකාරකම 02**

- මෙය කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස යොදා ගන්න
- සුදුසු පරිදි සිසුන් කණ්ඩායම් කරන්න
- ඇමුණුම 01 කාර්ය පත්‍රිකාව කණ්ඩායම් අතර බෙදා දෙන්න
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳ කරුණු ඇතුළත් පෙළ පොත හා වෙනත් මූලාශ්‍රය ද සපයන්න (9 ශ්‍රේණිය, 11 ශ්‍රේණිය, ඉතිහාසය පැරණි විෂය නිර්දේශයේ පෙළ පොත්, පුවත් පත්, සඟරා ලිපි ආදිය රැස් කර ගැනීමට සිසුන් දැනුම්වත් කරන්න)

- පිටු පෙරළන මාස දොළහේ කැලැන්ඩරයක් සපයාගන්න
- එම පිටුවක ප්‍රමාණයට ඩිමයි කඩදාසි හෝ සුදු පැහැති කඩදාසි හෝ 6 ක් කපා ගන්න
- තුණ්ඩුවල ලියා රවුම් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හය අහඹු ලෙස තෝරා ගැනීමට සලස්වන්න
- කණ්ඩායමට ලැබුණු මාතෘකාවට අදාළව වැදගත් තොරතුරු සාකච්ඡා කර ගොනු ගත කර ගැනීමට කණ්ඩායම්වලට මඟ පෙන්වන්න
- ලබා දුන් ඩිමයි නැතහොත් සුදු කඩදාසියේ නිර්මාණශීලී ව පිටුව සකස් කර ගැනීමට කණ්ඩායම්වලට මඟ පෙන්වන්න
- කණ්ඩායමේ නිර්මාණය පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී නිර්මාණය අගයන්න
- පිටු පෙරළන කැලැන්ඩරය සඳහා මුල් පිටුවක් ද නිර්මාණාත්මක ව සකස්කර අලවන්න
- ඇතුළු පිටුවල (එක පිටුවක එක බැගින් සිටින සේ) අනුපිළිවෙළින් කණ්ඩායම් නිර්මාණය කැලැන්ඩරයේ අලවන්න
- පිටු පෙරළන කැලැන්ඩරයක් සේ වැඩ අවසන් කර පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න

**ගුණාත්මක යෙදවුම්**

- පිටු පෙරළන කැලැන්ඩරයක් / එම කැලැන්ඩර් කොළයක පරිමාණයට සකස් කර ගත් ඩිමයි හෝ සුදු කඩදාසි පිටු 06 ක්
- පෙළ පොත හා වෙනත් අදාළ මූලාශ්‍රය / පින්තූර පුවත්පත් ලිපි ආදිය, ප්ලැටිග්නම්, ගම්

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව**

**පහත සඳහන් කරුණු යටතේ එක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව කරුණු පෙළ ගස්වන්න**

- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයට අදාළ වැදගත් යෝජනා
- ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල යහපත්, අයහපත් ලක්ෂණ

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්**

**පහත සඳහන් නිර්ණායක ඇසුරින් තක්සේරුව හා ඇගයීම සිදු කරන්න**

- තම මාතෘකාවට අදාළව නිවැරදි ව තොරතුරු රැස් කරයි
- වැදගත් යෝජනා නම් කරයි
- ආණ්ඩුක්‍රම  ප්‍රතිසංස්කරණවල යහපත්, අයහපත් ලක්ෂණ සාකච්ඡා කරයි
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි
- නිර්මාණශීලීව පිටු පෙරළන කැලැන්ඩරයක් සකසයි

Draft

## 6. නිදහසින් පසු ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාව වසර 133 කට අධික කාලයක් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටතේ පාලනය විය. 1948 වර්ෂයේ දී ලංකාවට නිදහස ලැබිණි. ඒ සමඟ ම ලංකාවට පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබුණ බැවින්, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය මගින් දේශපාලනයට සම්බන්ධ වීමට ලාංකිකයන්ට අවස්ථාව ලැබුණි. ඒ අනුව නිදහසින් පසු බලයට පත් වූ ආණ්ඩු හා එම ආණ්ඩුවල වැඩපිළිවෙළ පිළිබඳ ව කෙටියෙන් කරුණු සාකච්ඡා කිරීම මෙම පරිච්ඡේදයෙන් සිදු වේ. එමෙන් ම ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීම, විධායක ජනාධිපතික්‍රමය ආරම්භ වීම මෙන් ම නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය හා සමාජ සුභ සාධන කටයුතු පිළිබඳ ව ද කෙටියෙන් කරුණු සාකච්ඡා කෙරේ.

**නිපුණතාව:** • දිනාගත් නිදහස ඵලදායී ව භාවිතා කිරීමට පෙලඹෙයි.

**නිපුණතා මට්ටම:** 6.1 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික සංවර්ධනය විස්තර කරයි.

**කාලච්ඡේද :** 10 යි.

**ඉගෙනුම් පල :** • නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික කටයුතු විස්තර කරයි.

**පාඩම් සැලසුම සඳහා උපදෙස්**
**පහත සඳහන් විෂය කරුණු ඇසුරෙන් පාඩම සැලසුම් කරගන්න**

- 1947 දී පළමු පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම හා ලාංකිකයන්ට නිදහස ලැබීම
- නිදහසින් පසු ලංකාවේ පැවැත් වූ මහමැතිවරණ හා පත් වූ ආණ්ඩුවල වැඩ පිළිවෙළ

- **1952 මහ මැතිවරණය හා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව**

  - එක්සත් ජාතික පක්ෂය ජය ගැනීම හා ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරට පත්වීම
  - ඩඩ්ලි සේනානායක මහතා අගමැති තනතුරෙන් ඉල්ලා අස්වීම හා එම තනතුරට ජෝන් කොතලාවල මහතා පත්වීම
  - 1955 දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ගැනීම

- **1956 මහ මැතිවරණය හා නව ආණ්ඩුව**

  - මෙම මැතිවරණය ශ්‍රී ලාංකේය දේශපාලන ඉතිහාසයේ සන්ධිස්ථානයක් වීම
  - එක්සත් ජාතික පක්ෂයට විරුද්ධ ව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තවත් පක්ෂ කිහිපයක් සමඟ එකතු වී මහජන එක්සත් පෙරමුණ පිහිටුවා ගැනීම
  - එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා මෙම මැතිවරණයේ දී සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේගයක සහාය ලබා ගැනීම
  - මහජන එක්සත් පෙරමුණ ජයග්‍රහණය කිරීම හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා අගමැති තනතුරට පත්වීම
  - මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ක්‍රියාත්මක කළ කැපී පෙනුණු කාර්යයෝ
    * දේශීය කර්මාන්ත හා ගොවිතැන් දියුණු කිරීම
    * ජනසතු ව්‍යාපාර පුළුල් කිරීම
    * සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම

- **1960 ජූලි මහ මැතිවරණය හා නව ආණ්ඩුව**

    - 1960 මාර්තු මහ මැතිවරණයෙන් කිසිදු ජක්ෂයකට බහුතර බලයක් ලබා ගැනීමට නොහැකි වූ අතර, ඩඩ්ලි සේනානායක මහතාගේ නායකත්වයන් යුතු එක්සත් ජාතික පක්ෂය, පක්ෂ කිහිපයක් සමඟ එකතු වී ආණ්ඩුවක පිහිටුවීම එහෙත් පාර්ලිමේන්තුව විවෘත කිරීම සඳහා පවත්වන ලද රාජාසන කතාවෙන් ම ආණ්ඩුව පරාජයට පත් වීම. මේ නිසා ආණ්ඩුව විසුරුවා හැරීම
    - 1960 ජූලි පැවැත් වූ මහ මැතිවරණයෙන් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජය ගැනීම හා සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිනිය වීම
    - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විසින් ලංකා සමසමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය වැනි වාමාංශික පක්ෂ සමඟ එකතු වී සමඟි පෙරමුණු ආණ්ඩුව පිහිටුවීම
    - ජනසතු ව්‍යාපාරය ඉදිරියට ගෙන යාම
    - දේශීය ආර්ථිකය නඟා සිටුවීමට යොමු වූ පිළිවෙතක් ඉදිරියට ගෙන යාම

- **1956 මහමැතිවරණය**

    - එක්සත් ජාතික පක්ෂය ජය ගැනීම හා ඩඩ්ලි සේනානායක මහතා තෙවන වරට ද අගමැති තනතුරට පත්වීම

- **1970 මහමැතිවරණය**

    - සමගි පෙරමුණු ආ්ඩුව ජය ගැනීම හා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය වීම
    - 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දීම හා ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීම

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් - 01**

නිදහසින් පසු 1970 දක්වා ශ්‍රී ලංකාවේ පැවැත් වූ මහමැතිවරණය පිළිබඳ ව තොරතුරු ඇතුළත් වන පහත සඳහන් වගුව සම්පූර්ණ කිරීමට සිසුන් යොමු කරවන්න.

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරවන්න
- සිසු ක්‍රියාකාරකම ඇගයීමට ලක් කරන්න

ඇමුණුම -01

| මහමැතිවරණය | ජයගත් පක්ෂය | පත්වූ අගමැතිවරයා | පත්වූ, ආණ්ඩුව විසින් සිදු කළ වැදගත් කාර්ය |
|---|---|---|---|
| | | | |

- **1972 පළමු ජනරජ ව්‍යවස්ථාව**
  - මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින්,
  - ලංකාව නමින් හැඳින්වූ රට ශ්‍රී ලංකාව නාමයෙන් හැඳින්වීම
  - බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමග සියලු බැඳුම්වලින් මිදීමට විධිවිධාන යෙදීම
  - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රටේ උත්තරීතර නීතිය බවට පිළිගැනීම

- 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ
  - නාමික විධායකය වූ ජනාධිපති ධුරය
  - ජාතික රාජ සභාව
  - අගමැති ප්‍රධාන කැබිනට් මණ්ඩලය
  - අධිකරණ පද්ධතිය

- **1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව**
  - 1977පැවැති මහමැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂය ජයගත් අතර, එහි නායක ජේ.ආර්. ජයවර්ධන මහතා, විධායක ජනාධිපති ක්‍රමය සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනයට කටයුතු කළේ ය.
  - 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන අංග ලක්ෂණ
  - විධායක ජනාධිපති ධුරය
  - අගමැති හා අමාත්‍යමණ්ඩලය
  - පාර්ලිමේන්තුව
  - අධිකරණය
  - මූලික මිනිස් අයිතිවාසිකම්

**ක්‍රියාකාරකම් - 02**
**1972 හා 1978 ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යස්ථා ඇසුරින් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න**

- ඇමුණුම අංක 02 හි සඳහන්, වගුව හුනු පුවරුවේ ඇඳ දක්වන්න.
- වගුවෙහි වම පස තීරුවෙහි ඇති මාතෘකා සම්බන්ධයෙන් 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල ඇති කරුණු පිළිබඳව සිසුන්ගෙන් විමසීමක් කරන්න.
- සිසු ප්‍රතිචාර වගුවෙහි සටහන් කරන්න. වගුවෙහි සටහන් කිරීම සඳහා ද, සිසුන් යොමු කරවිය හැකි ය.
- පසුව ඌණ පූර්ණ සපයමින් 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල වෙනස්කම් පහදා දෙන්න. සෑම සිසු වෙකුටම  වගුව පිටපත් කිරීමට අවස්ථාව සලසා දෙන්න.

ඇමුණුම -02

| මාතෘකාව | 1972 ව්‍යවස්ථාව | 1978 ව්‍යවස්ථාව |
|---|---|---|
| ජනාධිපති ධුරය | | |
| අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය | | |
| ව්‍යවස්ථාදායකය | | |

**නිදහසින් පසු ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු**

- **සංවර්ධන කටයුතු**

    - වී ගොවිතැන දියුණු කිරීම
    - කාර්මික අංශයේ ඇති වූ දියුණුව
    - අධ්‍යාපන සංවර්ධන කටයුතු

- **සමාජ සුභසාධනය**

    - සෞඛ්‍ය පහසුකම් ඉහළ නැංවීම
    - සහනාධාර ලබාදීම
    - ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් වැඩි දියුණු කිරීම

**ක්‍රියාකාරකම් - 03**

**නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඇති වූ සංවර්ධන කටයුතු හා සුභසාධන කටයුතු ඇසුරෙන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොමු කරවන්න.**

- මෙය කේවල ක්‍රියාකාරකමක් ලෙස සිදු කරන්න
- ඇමුණුම 02 හි සඳහන් වගුව හුනු පුවරුවේ ඇඳ දක්වන්න
- එම වගුවෙහි අභ්‍යාස පොතේ සටහන් කොට මැද තීරුවෙහි ඇති මාතෘකාවලට අදාළ ව තොරතුරු පෙළපොත ඇසුරෙන් සොයා, කරුණු තුන බැගින් දකුණු පස තීරුවෙහි ලියන ලෙස උපදෙස් දෙන්න.
- ක්‍රියාකාරකම සිදු කිරීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.

ඇමුණුම -03

| | මාතෘකාව | මාතෘකාවට අදාළ තොරතුරු |
|---|---|---|
| සංවර්ධන කටයුතු | වී ගොවිතැන | 1.<br>2.<br>3. |
| | කාර්මික අංශයේ සියුණුව | |
| | අධ්‍යාපන කටයුතු | |
| සුබසාධන කටයුතු | සෞඛ්‍ය පහසුකම් ලබා දීම | |
| | සහනාධාර ලබාදීම | |
| | ග්‍රාමීය ප්‍රදේශවල පහසුකම් වැඩිදියුණු කිරීම | |